**ශීර්ෂය - 410 සමාගම් වතු ප්‍රතිසංස්කරණ ,තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි මස 29 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමාගම් වතු ප්‍රතිසංස්කරණ,තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරන ගැසට් නිවේදනය මගින් 2020 ඔක්තෝබර් 06 දින ස්ථාපිත කර තිබූ හෙයින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**දේපළ පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට (SA 82) අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු 6,431,852ක් ලෙස සඳහන් කර තිබුණ ද, මූල්‍ය ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි(ඒසීඒ -6) ආරම්භක ශේෂයක් දක්වා නොතිබුණි. මෙම වෙනසට හේතුව හඳුනාගෙන එය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ SA 82 මූල්‍ය නොවන වත්කම් වල ආරම්භක ශේෂය ලෙස රු.6,431,852 ක් දැක්වේ. එය මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ 6) 2 (1) හි අත්පත්කර ගැනීම් ලෙස දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ SA 82කට අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය හා මූල්‍ය ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ -6) මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය අතර වෙනස නිවැරදි කර ගත යුතු වේ. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 891(i) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වුවද එසේ පවත්වා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 14ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් රු.516,150,956 ක මුදලක් එනම් සියයට 7 සිට සියයට 81ක් අතර දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය නිසා ක්ෂේත්‍ර ගත වැඩ සටහන් ක්‍රියාත්මක කිරිමේ ගැටළු ඇතිවිම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වීම් සිදුවිය. | සලසාගත් ප්‍රතිපාදන උපයෝජනය කල යුතු වේ. |
| (ආ) | මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 04ක් සඳහා ප්‍රතිපාදිත රු.880,000ක සම්පූර්ණ මුදලම ඉතිරි වී තිබුණි. | අමාත්‍යාංශය සඳහා ප්‍රමාණවත් කාර්යාල පරිශ්‍රයන් නොමැති විම, රාජකාරි කටයුතු කිරිමට අවශ්‍ය කාර්යාල උපකරණ, පරිගණක හා උපාංග අවශ්‍ය පරිදි නොමැති වීම හේතුවෙන් මෙම වියදම් දැරිමේ අවශ්‍යතාවයක් ඇති නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | එක් එක් වැය විෂයන් සඳහා අවශ්‍ය මූල්‍ය ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව සැකසිය යුතු වේ. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මූල්‍ය ප්‍රකාශයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන-iii) දක්වා නොමැති රු. 28,421ක බැරකම් 2021 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවලදී නිරවුල්කර තිබුණි. | 2020 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී ආයතනය වෙත ගෙවීමට තිබූ බිල්පත් ලැබීම් ප්‍රමාද වීම හේතුවෙන් මෙම ගෙවීම් බැරකම් ප්‍රකාශයට ඇතුළත් කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශයේ බැදීම් හා බැරකම් පිළිබද ප්‍රකාශය සකස් කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාළ සියලුම බැරකම් එයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණ නොවීම මත පවත්නා මානව සම්පත් උපරිම ලෙස භාවිතා කරමින් අමාත්‍යාංශයේ කටයුතු පවතවා ගැනීමට කටයුතු කරනු ලබන අතර මාසිකව පවත්වනු ලබන මාණ්ඩලික නිලධාරි රැස්වීම් වලදී අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම පිළිබඳව සාකච්ඡා කර සුදුසු පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී මූල්‍ය පාලනය පිළිබඳ සමාලෝචනය සිදුකර වාර්තා කිරීමට කටයුතු කරමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයන් ඇති බවට ගණන්දීමේ නිලධාරියා සහතික විය යුතු වුවත් එම අවශ්‍යතාවයන්ට අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. යහපාලනය

### 3.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | ඉදිරි මස තුළදී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය 91 දෙනෙකු වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 47 දෙනෙකු වූ අතර පුරප්පාඩු ප්‍රමාණය 44 දෙනෙකු බව විගණනයේ දී නිරීක්ෂණය විය. විගණනය දිනය වන විටත් මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පවතින තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙසට රාජ්‍ය සේවා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |